ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුලි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 01 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූල්‍ය නොවන වත්කම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් නිල නිවසේ මුරකුටිය ඉදිකිරීම සඳහා රු.1,991,277ක්ද, දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිලි සංකීර්ණයේ දිසාපති නිල කාමර පරිශ්‍රයේ **CCTV** කැමරා සවිකිරීම සඳහා රු.162,375ක් හා දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය වෙන්කිරීම් (ඇලුමිනියම් පාර්ටිශන්) ඇතුළු අනෙකුත් මූලධන වියදම් සඳහා රු.20,655,555ක්ද වශයෙන් එකතුව රු.22,809,207ක මූලධන වියදම මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුළත් කර නොතිබුණි.	විගණන නිරීක්ෂණ වල පෙන්වා ඇති කරුණු ද අවධානයට ගෙන මෙවැනි වත්කම් ප්‍රත්‍යාගණනයේදී සැලකිල්ලට ගැනීමටත්, එම ප්‍රත්‍යාගණන අගයන් ගිණුම් ගත කිරීමටත් කටයුතු කිරීමට සටහන් කර ගතිමි.	මූලධන වියදම් නිවැරදි වැය විෂයයට ගිණුම් ගත කර එම වටිනාකම මූල්‍ය නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශයට ඇතුළත් කළ යුතුය.
(ii)	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06කට අදාල සේවා පියස්/ ග්‍රාම නිලධාරී කාර්යාල ගොඩනැගිලි 50 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ගිණුම්ගත කර නොමැති ඉඩම් හා ගොඩනැගිලි හඳුනා ගෙන ඇති අතර, ඊට අදාළ තක්සේරුව 2025 මාර්තු මාසයේදී සිගාස් වැඩසටහනට ඇතුළත් කර ඇති බව කාරුණිකව දැනුම් දෙමි.	තක්සේරු කර නොමැති ගොඩනැගිලි හඳුනා ගෙන කඩිනමින් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(iii)	වර්ග අඩි 13,446ක වපසරියකින් යුතු කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ගොඩනැගිලි වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් වී නොමැති නමුත් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාල සීමාව තුල පමණක් මූලධන වැය විෂයන් 02 ක් මඟින් රු.12,466,438ක වියදමක් දරා තිබුණි.	විගණන නිරීක්ෂණ වල පෙන්වා ඇති පරිදි මූල්‍ය නොවන වත්කම් යටතේ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්ගත කිරීමට සටහන් කර ගතිමි.	ගොඩනැගිලි වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.
(iv)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවතින වාහන 51 අතරින් වාහන 05ක අයිතිය වෙනත් අමාත්‍යාංශ සතු වන අතර, වාහන 46ක අයිතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව පවතින බවත් දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ රු.180,644,288**ක** ශේෂය වාහන 42කට අදාළව හඳුනාගෙන තිබීමෙන් වාහන 04ක වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.	ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලද වාහන 02ක අයිතිය පවරා ගෙන ඇති අතර අනෙකුත් වාහන වල අයිතිය ද පවරා ගැනීමට කටයුතු කරන බව.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහනවල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු අතර, අයිතිය සතු සියලුම වාහන තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය.

(ආ) විගණන සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම්වල ප්‍රවාහන උපාංග 42කට අදාළව රු.180,644,288ක ශේෂය සඳහා ඉදිරිපත් කරන ලද සිගාස් පරිගණක දත්ත වාර්තාවෙහි අදාළ ප්‍රවාහන උපාංග එකිනෙක වෙන් වෙන් වශයෙන් නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි තොරතුරු ඇතුලත්කර නොතිබුණි. ඊට අදාළව ගිණුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වාර්තාවෙහිද ප්‍රවාහන උපාංග 34කට අදාළ තොරතුරු පමණක් ඇතුලත් කර තිබූ අතර එම ප්‍රවාහන උපාංගවලද වටිනාකම් සනාථ කිරීමට විධිමත් උපලේඛන හෝ තක්සේරු වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ රු.180,644,288ක ප්‍රවාහන උපාංග ශේෂය සනාථ කර ගැනීමට ප්‍රමාණවත් විගණන සාක්ෂි නොමැති විය.	CIGAS වැඩසටහනෙහි දත්ත ඇතුළත් කිරීමේදී මූලික ලියවිල්ලක් පදනම් කර ගනිමින් වත්කම් ඇතුළත් කිරීම ආරම්භක අවස්ථාවේ සිදු කර ඇත. මේ සම්බන්ධව මූලික ලේඛන ඊට අදාළ ගොනුව ඇතුළත් කර තිබුණි.	ගිණුම් ශේෂ සනාථ කර ගැනීමට විධිමත් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 32 ක් සඳහා ලබා දී තිබුණු එකතුව රු.1,343,569,420 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,173,216,302 ක් පමණක් උපයෝජනය කර තිබුණු හෙයින් ඉතිරි වීම් රු.170,353,118 ක් වූ අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි. මූලික හා පරිපූරක ඇස්තමේන්තු සැකසීමේ දී හා මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් අයදුම් කිරීමේ දී සලකා බැලිය යුතු	විගණන නිරීක්ෂණ පිළිගන්නා අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දුනිමි.	තාත්වික හා නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු අතර, වෙන් කළ ප්‍රතිපාදන පූර්ණ උපයෝජනය සඳහා විධිමත් වැඩපිළිවෙලක් යෙදීමටද කටයුතු කළ යුතුය.

සියලුම නිර්ණායක පිළිබඳ ප්‍රමාණවත් සැලකිල්ලකින් තොරව ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය විෂයයන් 06 කට අදාළ රු.1,413,840ක් වූ බැරකම් හඳුනා ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බැරකම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	විගණන නිරීක්ෂණ පිළිගන්නා අතර මෙවැනි තත්වයන් ඇති නොවන පරිදි කටයුතු කිරීමටත් මු.රෙ. 214 අනුව අදාළ ලේඛන පවත්වාගෙන පාලන කටයුතු කිරීමට කටයුතු කරමි.	නිසි පරිදි බැරකම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2018 අංක 19 දරන විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව කටයුතු සිදු කරනු ලබන අතර, මේ සම්බන්ධව කාලීනව තොරතුරු සාකච්ඡා කිරීම් හා සමාලෝචනය කිරීම් සිදු කරනු ලබන අතර ඒ සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම්, ප්‍රාදේශීය ලේකම් මාසික රැස්වීම අවස්ථාවන් ද යොදා ගනු බලන බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.2, 4.2.4, 4.2.5, 4.4 , 4.5, 4.6 හා 6.3 වගන්ති	විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.488,915 ක්ද, වැඩ තහනම් කළ නිලධාරීන් තිදෙනෙකුගෙන් රු.86,946 ක්ද, සේවය හැර ගිය නිලධාරීන් 3 දෙනෙකුගෙන් රු.323,425 ක්ද, මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.282,555ක් ද, වශයෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට වසර 01 ක සිට වසර 20 ක් අතර කාලයක සිට පැවත එන එකතුව රු.1,181,841ක හිඟ ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය රු.2,952,648ක ශේෂයෙන් 2025 මැයි 01 දිනට රු.1,181,841ක් අයවිය යුතුව පවතී.	කාලීනව හිඟ ණය ශේෂ අයකර ගැනීමට පියවර නොගත් නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීමටත්, ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් පියවර ගැනීමත් කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
	(i) මුදල් රෙගුලාසි 177(2)	එකතු කරන නිලධාරීන් සහ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඔවුනට ලැබෙන සියළුම මුදල් හැකිතාක් ඉක්මණින් හෝ සෑම සතියකටම අඩුම තරමේ එක් වරක් බැගින් ප්‍රතිග්‍රාහක කාර්යාලයට යැවිය යුතුය. නමුත් හැඳුනුම්පත් ගාස්තු, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් අංශය වෙත ඉදිරිපත් කිරිමේදි උක්ත විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කළ අවස්ථා 10 ක් කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවතුණි.	නිරීක්ෂණ මඟින් පෙන්වා ඇති අඩු පාඩු නිවැරදි කර ගැනීමට කටයුතු සිදු කරනු ලබන අතර ක්ෂේත්‍රයේදී එකතු කරනු ලබන මෙවැනි මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණෙන පළමු අවස්ථාවේදීම මුදල් බැඳීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ලැබෙන මුදල් ප්‍රතිග්‍රාහක කාර්යාලයට යැවීමට කටයුතු කළ යුතුය.

(ii)	මුදල් රෙගුලාසි 394(ඇ)	අවලංගු කළ චෙක්පත් වටිනාකම කාර්යාලයට ලැබුණු මුදලක් සේ සලකා නියමිත ගිණුමට බැර කළ යුතු නමුත් ඒ අනුව කටයුතු කිරීමකින් තොරව රු.762,288ක අවලංගු කළ චෙක්පත් වටිනාකම තෙවන පාර්ශව පොදු තැන්පත් ගිණුමේ මාස 06 - මාස 32 කාලයක සිට රඳවාගෙන තිබුණි.	විගණන නිරීක්ෂණ පිළිගන්නා අතර මෙවැනි වැරදි නැවත ඇති නොවීමට කටයුතු කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිවැරදි කිරීම් කළ යුතුය.
(ඇ)	ආයතන සංග්‍රහයේ XLIII වැනි පරිච්ඡේදයේ 13.2 වගන්තිය (සංශෝධනය)	2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි යම් චෝදනාවකට ලක් වූවන් සම්බන්ධයෙන් මාස දෙකක් ඇතුළත දී මූලික විමර්ශණයක් පැවැත්විය යුතු බව දක්වා තිබුණ ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක චූදිත නිලධාරීන් 05 දෙනෙකු සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් පැවැත්වීම සඳහා මාස 04 ත් මාස 48ත් අතර කාල සීමාවක් ගත කර තිබුණි.	විගණන නිරීක්ෂණ අවධානයට ගෙන මුදල් රෙගුලාසි අනුව කටයුතු සිදු කිරීමට හා අදාළ මූලික විමර්ශන කඩිනමින් සිදු කරන ලෙසට නිලධාරීන්ට උපදෙස් ලබා දුනිමි.	ආයතන සංග්‍රහයේ සහ චක්‍රලේඛ විධිවිධාන අනුව, මූලික විමර්ශන කඩිනමින් පැවැත්වීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2008 පෙබරවාරි 6 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පුරවැසි හා සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර තිබුණද සේවා යාවත්කාලීන කිරීම, පසු විපරම, ඇගයීම හා වැඩි දියුණු කිරීම සම්බන්ධව උක්ත චක්‍රලේඛ විධිවිධාන අනුව 2024 වර්ෂයේදී කටයුතු කළ බවට ප්‍රමාණවත් ලිඛිත තොරතුරු පවත්වා නොතිබුණි.	පුරවැසි ප්‍රඥප්තියට අදාළව අධීක්ෂණය කිරීම සම්බන්ධව කටයුතු සිදු කරනු ලබන බව.	චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි හා සේවාලාභී ප්‍රඥප්තියක් විධිමත්ව සකස් කිරීම, ප්‍රවර්ධනය කිරීම, සේවා යාවත්කාලීන කිරීම, පසු විපරම හා ඇගයීම් කටයුතු සිදු කළ යුතුය.
(ඉ)	2019 මැයි 31 දිනැති අංක 14/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	පාදුක්ක,හෝමාගම හා කඩුවෙල, යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 හි විශ්‍රාම වැටුප් ලිපි ගොනු 921 ක් 2024 දෙසැම්බර් 31 දිනටත් චක්‍රලේඛය ප්‍රකාරව සංශෝධනය කර නොතිබුණු අතර අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 හි සංශෝධනය කළ යුතු විශ්‍රාම වැටුප් ලිපි ගොනු සංඛ්‍යාව නිශ්චිතව හඳුනාගෙනද නොතිබුණි.	සංශෝධනය නොකළ හා සංශෝධනය කලද වැටුප් වැඩිනොවූ ලිපිගොනු යම් ප්‍රමාණයක් තිබිය හැක. ඉදිරියේදී මෙවැනි අවස්ථාවන්හිදි වාර්තා තබා ගන්නා ලෙස උපදෙස් ලබාදෙන ලදි.	චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් ලිපි ගොනු සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු අතර, ඒවා කාලීනව සිදු නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.

(ඊ)	2019 මැයි 30 දිනැති අංක 02/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 06 ඡේදය	මිය ගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු කාලීනව ලබාගෙන විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ නාමලේඛනය යාවත්කාලීන නොකිරීම මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක 2024 දෙසැම්බර් 31 දිනට මිය ගිය විශ්‍රාමිකයන් 485 දෙනෙකු වෙනුවෙන් අවිධිමත් ලෙස වැඩිපුර ගෙවීම් සිදුකර තවදුරටත් අයකර ගත යුතු රු.46,728,917 ක මුදලක් පැවතුණි.	2025 ජනවාරි 01 සිට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත මරණ වාර්තා කිරීම සඳහා ජංගම දුරකථන පද්ධතියක් (Mobil App) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ලබාදී ඇති අතර, වැඩිපුර ගෙවීම් අදාළ පාර්ශයවන්ගෙන් අයකර ගනිමින් පවතින අතර අයකල නොහැකි ගෙවීම් සඳහා නීතිමය කටයුතු සිදුවෙමින්ද පවතී.	මිය ගිය විශ්‍රාමිකයින්ගේ තොරතුරු කාලීනව යාවත්කාලීන කලයුතු අතර වැඩිපුර ගෙවූ මුදල් නොපමාව අයකරගත යුතු බවත්, විධිමත් පරීක්ෂාවක් සිදු කර, වැඩිපුර ගෙවීමට අදාළ සම්බන්ධිත පාර්ශව වෙත පියවර ගත යුතුය.

3.5 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයට පොදු තැන්පත් ගිණුම් 8ක රු.929,303,312ක ශේෂයක් පැවති අතර ඒ අතුරින් පොදු තැන්පත් ගිණුම් 2 කට අදාළව වසර දෙකක් ඉක්ම වූ නිරවුල් කර නොතිබූ එකතුව රු.27,954,311ක තැන්පතු ශේෂයක් පැවතුණි. තවද එකී ශේෂය තුල එකතුව රු.16,710,707ක් වූ වසර 5ක් ඉක්ම වූ තැන්පතු ද විය. මෙම තැන්පතු ගෙවා දැමීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ විධිමත් පියවර ගෙන නොතිබුණි.	අදාළ ඉදිකිරීම් අවසන් කර ඉංජිනේරු වාර්තා සහ නිර්දේශ වලින් අනතුරුව මු.රෙ.571 (3) පරිදි නිදහස් කිරීමට කටයුතු කරමි.	කල් ඉකුත් වූ තැන්පතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීම හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගැනීම හෝ කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	"ග්‍රාමීය මාර්ග සංවර්ධන" වැඩසටහන යටතේ 2024 වර්ෂයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක 2024 සැප්තැම්බර් වන විටත් ගිවිසුම්ගතව හෝ වැඩ ආරම්භ කර නොතිබූ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති 36 ක් සඳහා කොළඹ දිස්ත්‍රික්කය වෙත වෙන් කරන ලද රු.56,768,678ක ප්‍රතිපාදන ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත නැවත පවරා දී තිබුණි.	ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති වලට අදාළ ප්‍රතිපාදන, ප්‍රවාහන මහා මාර්ග අමාත්‍යාංශය වෙත පවරා දෙන ලෙස උපදෙස් ලැබී ඇති අතර ඒ අනුව ප්‍රතිපාදන පවරා දෙන ලදී.	සැලසුම් කළ පරිදි සමාලෝචිත වර්ෂය තුලදී අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ බවත්, අදාළ ප්‍රතිපාදන උපයෝජනය කිරීමට විධිමත් පරිදි කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීමත් කළ යුතුය.

(ආ)	විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12ක අනුමත ප්‍රතිපාදන රු.349,670,107කට අදාළ ව්‍යාපෘති 127ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	මැතිවරණ පැවති කාලයක් හෙයින් දේශපාලන අනපේක්ෂිත තත්වයන් හමුවේ සැපයුම්කරුවන් හා ලංසුකරුවන්ද ප්‍රසම්පාදන කටයුතු වලට ඉදිරිපත් නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව	- එම -

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	"සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" වැඩසටහන යටතේ සීතාවක පශු නිෂ්පාදන ගම්මාන වැඩසටහන මඟින් සාමාජිකයන් 14 දෙනෙකු වෙත ලබාදුන් රු.1,301,750ක් වටිනා සතුන් හා උපකරණ සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් ඌන උපයෝජිතව පැවතුණි. තවද ප්‍රතිලාභීන් 07 දෙනෙකුගේ එළුවන් 12 දෙනෙකු යම් යම් රෝග හේතුවෙන් මිය ගොස් තිබූ බව දක්වා තිබුණද කිසිදු පශු වෛද්‍ය වාර්තාවක් ලබා ගෙන නොතිබුණු අතර ප්‍රතිලාභීන් 04 දෙනෙකු වෙත ලබා දුන් එළුවන් 07 දෙනෙකු විකුණා තිබුණද එම ප්‍රතිලාභීන් වෙතින් ගිවිසුම් ප්‍රකාරව අදාළ වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	විකුණා ඇති එළුවන් 07 සම්බන්ධ ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට කටයුතු සිදු කර ඇත.	ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කළයුතු අතර වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය.
(ආ)	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ළහිරුගම වසමේ සීතාවක සෞභාග්‍යා පශු ගම්මාන ප්‍රතිලාභීන්ට පුහුණු හා අලෙවි ප්‍රදර්ශන මධ්‍යස්ථානයක් ලෙස අඩක් නිම කර තිබූ ඇල්ල කන්ද ශාලාව රු.1,286,159ක මුදලක් වැය කර ප්‍රතිසංස්කරණය කළ නමුත් සීතාවක සෞභාග්‍යා පශු ගම්මාන ව්‍යාපෘතිය අසාර්ථක වීම මත වර්තමානයේදී එම ගොඩනැගිල්ල එය නිම කිරීමේ අරමුණ වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.	මෙම ගොඩනැගිල්ල සෞභාග්‍යා පශු නිෂ්පාදන අලෙවිය සඳහා භාවිතා නොකලද මේ වන විට ප්‍රදේශයේ ස්වේච්ඡා සමිති ග්‍රාම සංවර්ධන සමිති, මරණාධාර සමිති වැනි සමිතිවල රැස්වීම් පැවැත්වීම හා එම ප්‍රජා ශාලාවට ආසන්න ප්‍රදේශ නාය යාමේ අවදානමකට ලක්වන ප්‍රදේශයක් බැවින් එවැනි අවදානම් අවස්ථාවලදි තාවකාලික සුරැකුම් මධ්‍යස්ථානයක් ලෙසද මෙම ගොඩනැගිල්ල භාවිතා කරනු ලබන බව.	ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කර එම ව්‍යාපෘති ක්‍රියාත්මක තත්ත්වයට පත් කර අරමුණු කරා ළඟා වීමට කටයුතු කිරීමත්, විධිමත් පරිදි ව්‍යාපෘති අධීක්ෂණය හා පසු විපරම් නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීමත් කළ යුතුය.
(ඇ)	මොරටුව ධීවර ආශ්‍රිත සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ලබාදී තිබුණු වටිනාකම රු.2,500,000ක් වූ මාළු වියලන යන්ත්‍ර 02ක උපයෝජනය කර නොතිබුණු අතර මාළු වියලන යන්ත්‍ර සමිති වෙත ලබා දීමේදී ආදර්ශ ගිවිසුම්	වියලන යන්ත්‍ර 2 අතරින් එක් වියලන යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා වෙනත් කොට්ඨාශයකින් ඉල්ලීමක් සිදු කර ඇති අතර එය පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. අනෙක් වියලන යන්ත්‍රය සඳහා	- එම -

	ආකෘතියේ අඩංගු වැදගත් මෙන්ම බලාත්මක කොන්දේසි හා අත්‍යාවශ්‍ය කරුණු ඇතුලත් නොකර ගිවිසුම් ගත වී තිබුණි. වෙරළාසන්න ප්‍රදේශයේ ජීවත්වන ධීවර ජනතාවගේ මාළු අස්වැන්න වැඩිකර ගැනීම, අල්ලා ගනු ලබන අතිරික්ත මාළු ප්‍රමාණය තාක්ෂණය යොදා ගෙන කරවල උම්බලකඩ සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික පුහුණුව හා දැනුම ලබා දීමේ පරමාර්ථ ඇතිව ආරම්භ කළ මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලබාගෙන නොතිබුණි.	කොට්ඨාශයේ ආයෝජකයකු යොදා ගැනීමට නියමිතය. ඉදිරියේදී පවරා දෙනු ලබන වියලන යන්ත්‍ර සඳහා අදාළ සමිති සමඟ සෞභාග්‍යා කාර්යාංශය මඟින් හඳුන්වා දෙන ලද ආදර්ශ ගිවිසුම් ආකෘතිය අනුව ගිවිසුම් ගත වීමට නියමිතව ඇත.	
(ඈ)	මොරටුව ධීවර ආශ්‍රිත සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ මාළු වියලන යන්ත්‍ර ස්ථාපනය කිරීම හා සෞභාග්‍යා සමිති පැවැත්වීම වෙනුවෙන් රු.2,926,723 ක වියදමින් මොරටුවැල්ල බටහිර වසමේ පිහිටි අතහැර දමා තිබූ ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර වසර තුනකට අධික කාලයක් ගත වුවද මෙම ගොඩනැගිල්ල අදාළ අරමුණු සඳහා භාවිතයට ගෙන නොතිබුණි.	ඉදිරියේදී තුන්වන පාර්ශවයක් සම්බන්ධ කර ගනිමින් නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට නියමිත අතර විදුලි සම්බන්ධතාවය ලබා ගෙන මාළු වියලීමේ ක්‍රියාවලිය ආරම්භ කර නිෂ්පාදන කාර්යයට යොදා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. මේ වන විට ගොඩනැගිලි ග්‍රාම නිලධාරි වසමේ පොදු සුභ සාධන කටයුතු සඳහා රැස්වීම් පැවැත්වීමට යොදා ගනී.	- එම -

4.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුළත් ඒ ඒ අංශයන්හි ක්‍රියාකරකම් 2024 වර්ෂය තුළදී ළඟා කර ගැනීම පිළිබඳ වූ සැලසුම් අංශය මඟින් ඉදිරිපත් කළ සමස්ත ප්‍රගතිය හා 2024 වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ දක්වා තිබූ ඒ ඒ අංශයන්ගේ අදාළ ක්‍රියාකාරකම් ඉටුකරගැනීමේ ප්‍රගතිය පරීක්ෂාවේදි අංශ 03ක, ක්‍රියාකාරකම් 06ක ප්‍රගතිය එකිනෙකට වෙනස් අගයක් ගෙන තිබුණි. වාර්ෂික කාර්ය සාධන වාර්තාව තුල 2024 වර්ෂයේ දූරියන් වගාව පිහිටුවීමේ අක්කර ප්‍රමාණය පිළිබඳව දක්වා තිබූ ප්‍රගතිය එක් එක් පරිච්ඡේදයන්හි එකිනෙකට වෙනස් අගයන් විය. මේ හේතුවෙන් සත්‍ය ප්‍රගතිය හඳුනාගැනීම අපහසු කාර්යයක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත්	ආයතන අංශයේ 2024 වර්ෂයේ මහජන පැමිණිලි සඳහා සැපයූ පිළිතුරු ප්‍රගතිය 38ක් ලෙස නිවැරදි විය යුතුය. සීතාවක ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ඇස්වත්ත ග්‍රාම නිලධාරී වසමේ අක්කර 1.75ක දූරියන් වගාවද සමස්ථ ප්‍රගතියට ඇතුලත් කරමින් දූරියන් වගාව ව්‍යාප්ත කිරීම යටතේ සමස්ථ අක්කර 9.75 ක් ලෙස සඳහන් කර ඇත.තවද කෘෂිකර්ම අංශයේ ජයග්‍රහණ දර්ශක යටතේ වගා කළ දූරියන් අක්කර 5ක් ලෙස දක්වා ඇත්තේ ඉලක්කය වන අතර එහි ප්‍රගතිය අක්කර 8කි.	ඉදිරිපත් කරනු ලබන සියලුම වාර්තාවන්හි ඒ ඒ අංශයන්ගේ අදාළ ක්‍රියාකරකම් ඉටුකරගැනීමේ ප්‍රගතිය නිවැරදි අගයෙන් දැක්විය යුතු අතර, නිවැරදි තොරතුරු මත වාර්තා සකස් වන බව තහවුරු වන වැඩපිළිවෙලක් සැකසිය යුතුය.

යම් යම් අංශයන්හි ඉලක්ක ළඟාකර ගැනීමේ කාර්යසාධනය විගණනයට නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

4.4 වත්කම් කළමනාකරණය

(අ) අඩක් නිමි ගොඩනැගිලි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මහරගම, කඩුවෙල, කෝට්ටේ, සීතාවක හා හෝමාගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුල අඩක් නිමි ගොඩනැගිලි 19ක් පැවති අතර ගොඩනැගිලි 16ක් සඳහා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉදිකිරීම් ආරම්භ කර ආසන්න පිරිවැය එකතුව රු.25,933,502ක් දරා තිබුණි. මෙම ගොඩනැගිලිවලින් බහුතරයක් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් භාවිතයට ගතහැකි මට්ටම දක්වා අවසන් කිරීමට නොහැකි වීම මත අඩක් නිමි තත්ත්වයේ පැවති අතර ඵලදායි කටයුත්තක් වෙනුවෙන් භාවිතයට ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.	මෙවැනි ව්‍යාපෘතියන් හඳුනාගෙන ග්‍රාම සංවර්ධන සැලැස්ම යටතේ එම යෝජනා ඇතුලත් කර ඉදිරි සංවර්ධන කටයුතු සිදු කිරීමට සටහන් කර ගතිමි.	අඩක් නිමි ගොඩනැගිලි භාවිතයට ගත හැකි මට්ටම දක්වා නිමකර ඵලදායි කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ) ඌන උපයෝජිත වත්කම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ජනාධිපති කාර්යාල වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර 2018 හා 2019 වර්ෂවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කර තිබුණු දිළිඳුකම තුරන් කිරීමේ පරමාර්ථය පෙරදැරි කරගත් "ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන" යටතේ සමිති 124 ක් ලියාපදිංචි කර තිබුණද 2024 දෙසැම්බර් 31 දිනට ඉන් සමිති 90 ක් අක්‍රියව පැවතුණි. එදිනට අක්‍රිය සමිති වලට අදාළ ග්‍රාම ශක්ති මව් සමිති ගිණුමෙහි රු.31,882,213ක් ද ක්ෂුද්‍ර මූල්‍ය ගිණුමේ රු.277,921 ක් වශයෙන් බැංකු ගිණුම්වල ශේෂව පැවති රු.32,160,134 ක මුදල් ඌන උපයෝජිතව පැවතුණි.	විගණන නිරීක්ෂණ පිළිගතිමි.	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වීම හෝ විධිමත් පරිදි කටයුතු කර ඌන උපයෝජිත මුදල් ආදායම හෝ කළ යුතුය.

(ඇ) වාහන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතා කරනු ලබන වාහන 51 අතරින් 2024 දෙසැම්බර් 31 දිනට අලුත්වැඩියාව සඳහා යොමුකර ඇති ධාවන තත්ත්වයේ නොපවතින වාහන 08ක් පැවති අතර එම වාහන මාස 03 සිට මාස 45ක කාලසීමාවක සිට ධාවන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. තවද 2024 දෙසැම්බර් 31 දිනට වාහන 05 ක අයිතිය දිස්ත්‍රික් ලේකම් නමට පවරාගෙන නොතිබුණු අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් විගණනයට ලද තොරතුරු ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් නමින් ලියාපදිංචි වී තිබූ වාහන 13 ක් දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නොපවතින අතර එම වාහන පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පවරා නොගත් වාහන පවරා ගැනීමට කටයුතු සිදු කර ඇත.	වාහනවල අයිතිය නිසි පරිදි පවරාදීම හෝ පවරා ගැනීමට කටයුතු කිරීම හා අලුත්වැඩියාවන් විධිමත් පරිදි කඩිනමින් සිදුකර වාහන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නොමැති වාහන 13 සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමත් කළ යුතුය.
(ii)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පරිහරණය කළ මෝටර් රථයක් 2021 අගෝස්තු 24 දින ඇති වූ කාර්මික දෝෂයක් මත අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවා රු.497,075කට අලුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී බව යාන්ත්‍රික ඉන්ජිනේරුවරයා විසින් 2021 සැප්තැම්බර් 21 දින නිර්දේශ කර තිබිය දී එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 03කට අධික කාලයක් තිස්සේ අනාරක්ෂිතව, අව් වැසිවලට නිරාවරණය වෙමින් එළිමහන් ස්ථානයක ගාල්කර තිබුණි.	මෙම මෝටර් රථය සහ ධාවන තත්වයේ නොමැති අනිකුත් වාහන ගාල් කර තැබීම සඳහා වැසි වලින් ආවරණය වන ස්ථානයක් සකස් කර එම වාහන ගාල් කර ඇති බව.	වාහන අලුත්වැඩියාවන් විධිමත් පරිදි කඩිනමින් සිදුකර වාහන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බවත්, එසේ කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමත් කළ යුතුය.
(iii)	අලුත්වැඩියාව සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාර දී තිබූ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඩබල් කැබ් රථයක් දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත රු.905,480ක් වැය කරමින් ප්‍රධානම මෙහෙයුම් ඒකකය වන එන්ජිමෙහි සහ ගියර් පද්ධතියේ	විගණන නිරීක්ෂණ අවධානයට ගනිමින්, යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ ලබා ගැනීමටත්, මෝටර් රථයේ අලුත්වැඩියාව සිදු කිරීම සඳහා කොපමණ මුදලක් වැය වන්නේ ද යන්න සම්බන්ධව නැවත වාර්තාවක් ලබා ගන්නා ලෙසත්, එම වාර්තාව අපහරණ	ප්‍රධාන යාන්ත්‍රික දෝෂ හඳුනා ගැනීමෙන් තොරව වෙනත් අලුත්වැඩියාවන් කිරීමට තීරණය ගැනීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර ඉදිරි කටයුතු කළ යුතුය.

	ක්‍රියාකාරීත්වය, පැවැත්ම සහ පවතින දෝෂයන් පිළිබඳ සලකා බැලීමෙන් තොරව මොටර් රථයේ සිසිලන, වායුසමීකරණ, තිරිංග පද්ධතීන් වල සහ මෝටර් රථයේ බඳෙහි තීන්ත පින්තාරු කිරීම් වැනි අලුත්වැඩියාවන් සිදුකර තිබුණි. එම අලුත්වැඩියාව සිදු කර වසරක් ගතවීමට පෙර මෙම මෝටර් රථයේ එන්ජිමෙහි සහ ගියර් පද්ධතියේ පවතින දෝෂයන් හේතුවෙන් අපහරණය කිරීම සඳහා නිර්දේශ කර තිබීමෙන් මෙම රථය අලුත් වැඩියා කිරීම සඳහා වැය කළ මුදල් නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.	කමිටුව වෙත යොමු කර, නැවත කමිටු නිර්දේශයක් ලබා ගැනීම සහ එම කමිටු වාර්තාව අනුව ඉදිරි කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරමි.	
(iv)	තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉන්ධන ධාරිතාවය ලීටර් 55ක්වූ මෝටර් රථයක ඉදිරිපත් කර තිබූ ධාවන සටහන්වල ලීටර් 789ත් 846ත් අතර අසාමාන්‍ය ඉන්ධන ප්‍රමාණයන් ඉන්ධන ටැංකියේ ඉතිරිය ලෙස දක්වා තිබුණද එයට හේතුවූ කරුණු අනාවරණය කරගැනීමකින් තොරව මාස 10කට අධික කාලයක් අඛණ්ඩව ඉන්ධන ලබා දීම සිදු කර තිබුණි. තවද අධික ලෙස සුදුදුම් පිටවීම හේතුවෙන් අලුත්වැඩියාවන් සිදුකර, එම අලුත්වැඩියාවන් සිදුකළ බවට තාක්ෂණික නිලධාරියාගේ නිර්දේශය 2023 දෙසැම්බර් 27 දිනැතිව ඉදිරිපත් කර ඒ සඳහා 2023 දෙසැම්බර් 28 දින රු.1,249,250ක් ගෙවීම් සිදු කර තිබුණු නමුත් මෙම මෝටර් රථයේ ධාවන සටහන් අනුව 2023 දෙසැම්බර් 09 දින මෝටර් රථය අලුත්වැඩියාව සඳහා යොමු කර තිබූ අතර අලුත්වැඩියාව නිමකර නැවත මෝටර් රථය ධාවනය සඳහා යොදා ගෙන තිබුණේ 2024 මාර්තු 12 දිනදීය. ඒ අනුව එම අලුත්වැඩියාව අවසන්වීමට පෙර ගෙවීම් සිදුකර තිබුණි.	මෙවැනි අඩුපාඩු ඇති නොවන පරිදි කටයුතු කිරීමටත්, වාහන අලුත්වැඩියා සිදු කිරීමේදී හැකිතාක් දුරට වාහන නියෝජිත ආයතන වෙත යොමු කිරීමටත් කටයුතු කිරීමට නිලධාරින්ට උපදෙස් ලබා දුනිමි.	මෝටර් රථයේ ඉන්ධන ධාරිතාවය ඉක්මවා ධාවන සටහන් වල ඉතිරි ඉන්ධන දක්වා තිබියදී ඉන්ධන නිකුත් කිරීම හා අලුත්වැඩියා කිරීමට පෙර ගෙවීම් සිදුකිරීම සම්බන්ධයෙන් අදාළ නිලධාරින්ට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය.

(ඇ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පරිහරණය කළ මෝටර් රථයක් සඳහා රු.1,158,950ක් වැය කර වසරක වගකීම් කාලයකට යටත්ව 2022 දෙසැම්බර් 20 දින අලුත්වැඩියාවක් සිදුකර 2023 ජූලි 28 දින දක්වා කිලෝමීටර් 3,435ක් පමණක් ධාවනය කර තිබූ අතර එදිනෙන් පසුව ධාවනය නොවීමට හේතු ඉදිරිපත් කර නොතිබුණි. තවද උක්ත අලුත්වැඩියාවට අදාළ වගකීම් කාලසීමාව අවසන් වූ පසුව එනම් 2024 මාර්තු 03 දින කාර්මික දෝෂයක් සම්බන්ධයෙන් වාර්තා කර තිබුණි. ඒ අනුව වගකීම් කාල සීමාව තුල නිසි පරිදි ධාවනය නොවීම මත වගකීම් කාලසීමාව තුලදී ලබාගත හැකිව තිබූ ප්‍රතිලාභ අහිමි වීමක් නිරීක්ෂණය වූ අතර 2025 අප්‍රේල් වන විටත් එනම් මාස 20කට අධික කාලයක සිට මෙම වාහනය ධාවනයට යොදා ගැනීමකින් තොරව අලුත් වැඩියාව සඳහා යොමුකර තිබුණි.	මෙම රථයේ පොදු 268 හි නිසි පරිදි ධාවන සටහන් ලියා නොමැති බව නිරීක්ෂණය වේ. එම නිසා මෙම වාහනය මාස 20කට අධික කාලයක් ධාවන නොවූ වාහනයක් සේ සලකා අලුත්වැඩියාව සිදු කර ඇත. මෙවැනි තත්වයන් ඇති නොවන පරිදි කටයුතු කිරීමටත්, ධාවන සටහන් ලේඛන, ලොග් පොත වැනි ඒවා නිවැරදිව පවත්වාගෙන යාමට නිලධාරින්ට උපදෙස් ලබා දුනිමි.	වාහන උපරිම කාර්යක්ෂමව , ඵලදායීව යොදා ගැනීමට හා ධාවන සටහන් නිසි පරිදි සම්පූර්ණ කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමටත්, රථය විධිමත්ව ධාවනය කර වගකීම් කාලය තුළ අලුත්වැඩියාවට යොමු නොකිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය.

4.5 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දින වන විට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 12 කට අධික කාලයක් ගත වී තිබුණද මේ සම්බන්ධයෙන් විමර්ශන අවසන් වී නොතිබීමෙන් එම හානි අයකර ගැනීම හෝ කපාහැරීම සිදුකළ නොහැකිව පැවතුණු අතර හානියේ වටිනාකම රු.92,606,688 ක් විය.	පොලිස් පරීක්ෂණ සහ රජයේ රස පරීක්ෂකවරයාගේ මතය අනුව තවදුරටත් විමර්ශන සිදුවන බැවින් පරීක්ෂණ කටයුතු අවසන් වීමෙන් පසුව භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදුකර විගණනයට වාර්තා කරන බව .	ගිනි ගැනීම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කඩිනමින් නිම කර ගැනීමට පියවර ගත යුතුය.
(ආ)	විශ්‍රාම වැටුප් ගෙවීමේදි මූලික වැටුප වැඩිපුර ගෙවීම, පාරිතෝෂික මුදල් වැඩිපුර ගෙවීම, ජීවන වියදම් දීමනාව, අන්තර් දීමනාව, යැපීම් දීමනා වැනි දීමනා වැඩිපුර ගෙවීම, විශ්‍රාම වැටුප් චක්‍රලේඛවලට අනුගත නොවී වැඩිපුර ගෙවීම යනාදී විවිධ හේතුන් මත කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට අදාළ බල	සිදුවී ඇති බොහෝ වැඩිපුර ගෙවීම් යම් කාලවලදී නිකුත් කල චක්‍රලේඛ අනුව පසුව අනාවරණය වූ වැඩිපුර ගෙවීම් වන බවත් ඒවා බොහෝ දුරට ප්‍රාදේශීය ලේකම් කාර්යාල පාලනයෙන් තොර හේතුමත සිදුවීම් වන අතර අනෙකුත් වැඩිපුර ගෙවීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින්	වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් මුදල් නොපමාව අයකරගත යුතු අතර වැඩිපුර ගෙවීම් සඳහා වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය.

	ප්‍රදේශයන්හි විශ්‍රාමිකයන් 181 දෙනෙකුට වැඩියෙන් ගෙවා, 2024 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් අයවිය යුතු රු.29,752,987 ක මුදලක් පැවති අතර ඒ අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක විශ්‍රාමිකයන් 12 දෙනෙකුගෙන් මියයාම හෝ වෙනත් හේතු මත අය නොවන ලෙස හඳුනා ගෙන තිබූ මුදල රු.2,458,613 ක් විය.	සිදුවූ සාවද්‍ය ගණනය කිරීම් මත සිදුවූ වැඩිපුර ගෙවීම් බව.	
(ඇ)	සීතාවක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 2016 ජුනි 05 දින "සාලාව" යුධ හමුදා කඳවුරේ හදිසි පිපිරීම හේතුවෙන් හානි වූ 427 ඒ සාලාව ග්‍රාම නිලධාරී වසමේ පදිංචි පුද්ගලයකුගේ නිවස සඳහා රු.3,635,000ක් වූ පළමු තක්සේරුව, 2016 සැප්තැම්බර් 23 දිනැති තක්සේරුව මඟින් රු.1,500,000 ක් ලෙස සංශෝධනය කර තිබුණි. එම සංශෝධිත තක්සේරුව 2016 සැප්තැම්බර් 26 දින සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණු නමුත් පෙර තක්සේරුව මත පදනම්ව එවකට සේවයේ නියුතු නිලධාරීන් විසින් රු.3,635,000 ක් ගෙවීම හේතුවෙන් උක්ත සඳහන් පුද්ගලයා වෙත රු.2,006,872ක මුදලක් වැඩිපුර ගෙවීමක් සිදු වී තිබුණි. 2025 පෙබරවාරි වන විට උක්ත සිදුවීම සිදු වී වසර 08 කට අධික කාලයක් ගත වී තිබුණද එම වැඩිපුර ගෙවීම අදාළ පුද්ගලයාගෙන් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	මේ සම්බන්ධව සිදු කළ දෙපාර්තමේන්තු පරීක්ෂණ වාර්තාව 2025 අප්‍රේල් 29 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට යොමු කර ඇත. මෙයට අමතරව නීතිපති දෙපාර්තමේන්තුව හරහා අවිස්සාවේල්ල දිසා අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති අතර එම නඩුවේ ඉදිරි කටයුතු මේ වන විටත් සිදු වෙමින් පවතින බව.	වැඩිපුර ගෙවා ඇති මුදල් නොපමාව අයකරගත යුතු අතර වැඩිපුර ගෙවීම් සඳහා වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය.
(ඈ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු මෝටර් රථයක් 2024 සැප්තැම්බර් මස 20 අනතුරට ලක්වී තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට එම හානියේ ඇස්තමේන්තු වටිනාකම හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශන තුළ තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු යටතේ දක්වා නොතිබුණි.	විගණන නිරීක්ෂණ වල පෙන්වා ඇති පරිදි මූලික පරීක්ෂණ කටයුතු සිදු වීම ප්‍රමාද වූ බව පිළිගනිමි. මේ වන විට අනතුර සම්බන්ධව මූලික පරීක්ෂණ කටයුතු සිදු කර අවසන් වී ඇති අතර අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අදාළව ඇස්තමේන්තුව රක්ෂණ සමාගම වෙත යොමු කර ඇති බව.	වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර පරීක්ෂණ කඩිනමින් පවත්වා තක්සේරු කරන හානි හා පාඩු මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොළඹ, දෙහිවල, කොලොන්නාව, රත්මලාන, සීතාවක, මොරටුව සහ කැස්බෑව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පවත්වාගෙන යනු ලබන ඉඩම්වල අයිතිය එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු නොවූ අතර ඒවායේ අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් නොහැකි වී තිබුණි.	ඉඩම් වල අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා ගැනීමට අදාළ ඉදිරි කටයුතු තවදුරටත් සිදු කරන බවත්, විගණන නිරීක්ෂණ වලට අවධානය යොමු කරමින් අයිතිය පවරා නොගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීමට නිලධාරින්ට උපදෙස් ලබා දුන් බව.	ඉඩම් වල අයිතිය අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පවරා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය.
(ආ)	සීතාවක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කොටබොඩවත්තේ පිහිටා ඇති රජයේ නිල නිවාසවලට අදාළ කුලී ආදායම දිගුකාලයක් සිට අයකර ගෙන නොතිබූ අතර උසාවි නියෝගයට අනුව කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් නොහැකි වී තිබුණි.	සමථ කොන්දේසිවලට අගතියක් නොවන ලෙස ගැටළුව විසඳා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස නීතිපති විසින් දන්වා තිබූ අතර අදාළ පාර්ශව සමඟ සාකච්ඡාවක් කළද, පදිංචිකරුවන් විසින් වෙනත් විකල්ප ඉඩම් හෝ නිවාස තමන්ට අවශ්‍ය නැති බවත්, ප්‍රකාශ කිරීම හේතුවෙන් එකඟතාවකට එළඹීමට නොහැකි විය. මේ සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති අතර නැවත සලකා බලන ලෙස නැවත දැනුම් දී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව.	උසාවි නියෝගයට අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක විශ්‍රාමිකයන් 125 දෙනෙකු සඳහා ස්ථිර හෝ තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනුවක් නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවමින් පැවති අතර සමාලෝචිත වර්ෂයේ දී පමණක් එකතුව රු.16,236,922 ක මුදලක් එසේ ගෙවා තිබුණි. තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක විශ්‍රාමිකයන් 202ක් සඳහා තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනු මඟින් සමාලෝචිත වර්ෂයේ දී පමණක් එකතුව රු.58,974,495 ක මුදලක් ගෙවා තිබුණි. මෙම තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනු අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ගොනු 64 ක් සඳහා අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ගොනු 242 ක් සඳහා තාවකාලික ගොනු සකස් කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර ඉතිරි ගොනු සම්බන්ධයෙන්ද ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. කෙසේ වෙතත් මෙම ගොනු වංචාසහගත ගොනු නොවන බවට තහවුරු වීම සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළව කුමන හෝ ලියවිල්ලක් ලබාගන්නා ලෙස උපදෙස් ලබා දී ඇත.	විශ්‍රාම වැටුප් ලිපි ගොනු නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවන විශ්‍රාමිකයන්ගේ ස්ථිර ලිපිගොනු සොයා ගැනීමට කටයුතු කිරීම හෝ විධිමත් අනුමැතිය යටතේ තත්කාලීන විශ්‍රාම ගොනු මත ගෙවීම් කිරීම කළ යුතු බවත්, මේ පිළිබඳව නිසි පරිදි කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත් කළ යුතුය.

(ඇ)	2024 වර්ෂය සඳහා 2024 ජූනි 30 දිනට ජීවිත සහතික යාවත්කාලීන කර නොමැති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9ක විශ්‍රාමිකයන් 122 දෙනෙකුගේ විශ්‍රාම වැටුප ගෙවීම 2024 ජූලි මස සිට අත්හිටවනු ලැබුවද මෙම විශ්‍රාමිකයන් මිය ගොස්ද **,** පදිංචිය හැර ගොස් තිබේද**,** විදේශ ගතවී තිබේද යන්න පිළිබඳ තොරතුරු 2025 මාර්තු 31 දිනටත් සොයා ගැනීමට නොහැකි වී තිබුණි.	2024 වර්ෂයට අදාළව පදිංචි සහතික ලබා නොදීම මත විශ්‍රාම වැටුප අත්හිටවනු ලැබූ විශ්‍රාමිකයන් 122 ගේ තොරතුරු 2025/03/31 දින වන විටත් තොරතුරු සොයාගත නොහැකි වී තිබුණි.	ජීවිත සහතික ලබාදී නොමැති විශ්‍රාමිකයන් පිළිබඳව පසු විපරම් කිරීම අප්‍රමාදව සිදු කර විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අවස්ථා අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 13 තුළ 2024 දෙසැම්බර් 31 දිනට අනවසරයෙන් අල්ලාගෙන තිබුණු ඉඩම් කැබලි සංඛ්‍යාව 973 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් ඉඩම් කච්චේරි 06ක් පවත්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක පමණක් බලපත්‍ර 12 ක් ලබා දී තිබුණි. අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 හි 2024 ජනවාරි 01 දිනට අනවසරයෙන් අල්ලාගත් ඉඩම් කැබලි 594 ක් පැවතිය ද සමාලෝචිත වර්ෂයේදී ඉඩම් කැබලි කිසිවක් නියමානුකූල කර නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13හි අනවසර ඉඩම් කැබලි 973 සම්බන්ධව දැනටමත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නියමානුකූල කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවති.	අනවසරයෙන් අල්ලා ගත් ඉඩම් විධිමත් පරිදි නියමානුකූල කිරීමට හෝ නැවත ලබා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

4.7 තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ 2024 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය යටතේ අංශ 32 කට අදාළව තිරසර සංවර්ධන අරමුණු 12 ක් යටතේ දර්ශක 203ක ප්‍රගතිය දක්වා තිබුණු අතර එයින් දර්ශක 11ක ප්‍රගතිය සියයට 50කට වඩා පහල අගයක්ද, දර්ශක 47ක ප්‍රගතිය සියයට 50 – 74 අතර අගයකද පැවති අතර දර්ශක 02ක ඉලක්කයන්ට අදාළව ළගා කර ගත් ප්‍රගතිය දක්වා නොතිබුණි.	විදුලි පද්ධති අලුත්වැඩියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 සිදු කර නොතිබුණි. සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කටයුතු සිදු කිරීම ආරම්භ කර ඇති අතර ඉතිරි කාර්යාල 02 ඉදිරි වර්ෂයේදී සිදු කිරීමට කටයුතු කරමි. සමෘද්ධි අංශය - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන නොමැති වීම කුඩා ව්‍යාපාර අංශය - බැංකු පොලී අනුපාතය ඉහල යාම නිසා ව්‍යවසායකයින් ආයෝජනයට ඉදිරිපත් නොවීම.	තිරසර සංවර්ධනය උදෙසා තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ජයග්‍රාහී දර්ශක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ දක්වා තිබූ තිරසර සංවර්ධන ඉලක්ක/දර්ශක 09ක් 2024 ක්‍රියාකාරි සැලැස්මෙහි අන්තර්ගත කර නොතිබීම	විගණන නිරීක්ෂණ අවධානයට ගෙන කාර්යය සාධන දර්ශක මැනීමට හැකිවන අයුරින් අන්තර්ගත ඉලක්කයන් දැක්වීමටත් එම දර්ශක	තිරසර සංවර්ධන අරමුණු වලට අදාළ කාර්යය සාධන දර්ශක මැනීමට හැකිවන අයුරින් අදාළ ඉලක්කයන්

හේතුවෙන් ඒවාට අදාළ 2024 වර්ෂයේ ඉලක්කය කොපමණද යන්න තහවුරුවක් නොවූ හෙයින් එම දර්ශක සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය විගණනයට මැනිය නොහැකි විය.	සාක්ෂාත් කර ගැනීමටත්, ප්‍රගතින් සාකච්ඡා කර ඉලක්ක කරා ලගා වන අයුරින් කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දුනිමි.	ක්‍රියාකාරී සැකැස්ම තුළ දැක්වීමට කටයුතු කළ යුතුය.
(ඇ) 2024 වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ දක්වා තිබූ තිරසර සංවර්ධන අරමුණුවල ඉලක්ක 02 ක ප්‍රගතිය විගණනය වෙත ඉදිරිපත් කරන ලද අනෙකුත් වාර්තාවන්හි සඳහන් ප්‍රගතිය සමඟ එකිනෙකට වෙනස් වූ අතර 2024 වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ දක්වා තිබූ තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු මත නිවැරදි තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.	විගණන නිරීක්ෂණ වල පෙන්වා ඇති පරිදි මෙවැනි වැරදි ඉදිරියේදි නිවැරදි කර ගැනීමට කටයුතු කරමි.	සියලුම වාර්තාවන්හි තිරසර අරමුණු ඉලක්ක ලබා කරගැනීමේ ප්‍රගතිය නිවැරදි හා ඒකාකාරිව දැක්විමට කටයුතු කළ යුතු බවත්, නිවැරදි දත්ත හා තොරතුරු වාර්තාවලට ඇතුළත් වන බව තහවුරු වන වැඩපිළිවෙලක් සැකසීමටත් පියවර ගත යුතුය.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මහජනතාව දෛනිකව නිරන්තරයෙන් සේවා ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් පැමිණෙන ආයතනයන් හි වැඩිම ඉල්ලුමක් ඇති සේවා සඳහා කාර්යසාධක දර්ශක හඳුනාගැනීම හා ඒවා ඉටුකරන ප්‍රමාණය මැනීම සඳහා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2020 ජනවාරි 24 දිනැති ස්වදේශ කටයුතු ගිණුම් චක්‍රලේඛ අංක 02/2018(II) මගින් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දී තිබුණු අතර 2024 වර්ෂයේදී එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වැඩිම ඉල්ලුමක් ඇති සේවා සඳහා කාර්යසාධක දර්ශක හඳුනාගැනීම, අදාළ ඉලක්කයන් ලබාදීම හා ප්‍රගතිය මැනීම සිදුකර නොතිබුණි.	විගණන නිරීක්ෂණ පිළිගනිමි.	චක්‍රලේඛය ප්‍රකාරව වැඩිම ඉල්ලුමක් ඇති සේවා සඳහා කාර්යසාධක දර්ශක හඳුනාගැනීම, ඉලක්ක පිහිටුවීම හා මැනීම සිදු කළ යුතු අතර, එසේ නොකිරීමට අදාළ පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට රාජකාරි කටයුතු සඳහා සක්‍රීය දායකත්වයක් නොමැති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක අනිවාර්ය නිවාඩු ගැන්වූ සේවකයින් 07 දෙනෙකු හා වැඩ තහනම් කළ එක් සේවකයකු වෙත වර්ෂ 2017 - 2024 කාලසීමාව තුල වැටුප් හා දීමනා ලෙස රු.8,880,468 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක අල්ලස් චෝදනා සම්බන්ධයෙන් අනිවාර්ය නිවාඩු මත සිටියදී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.12 වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වූ ග්‍රාම නිලධාරීන් තිදෙනෙකු සඳහා වැටුප් හා දීමනා ලෙස රු.1,615,529ක මුදලක් ගෙවා තිබුණු අතර ඒ අතරින් පුද්ගලයින් තිදෙනෙකුගෙන් රජයට අයවිය යුතු රු.261,970 ක මුදලක්ද පැවති අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අනිවාර්යය නිවාඩු ගන්වන ලද නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු සම්පූර්ණ මුදල වැටුප් ගෙවීමේදී සම්පූර්ණයෙන් අයකර ගන්නා ලෙසට නිලධාරීන්ට උපදෙස් ලබා දුනිමි.	රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට හා ආයතන සංග්‍රහයේ පවතින නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කළ නිලධාරියකු අල්ලස් චෝදනා මත රාජකාරි වැඩ තහනම් කර අල්ලස් හා දූෂණ පනතේ 19 (ආ) සහ සංශෝධිත පනතේ 19(ඇ) ප්‍රකාරව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තීරණය අනුව 2019 ජනවාරි 15 දින විත්තිකරු වැරදිකරු කර තිබුණි. ඉන්පසු නිලධාරීයා විසින් කොළඹ මහ අධිකරණයේ අභියාචනයක් ගොනු කර තිබුණද එයින්ද ඔහු වැරදි කරුවෙක් ලෙස තීරණය ලබා දී තිබුණි. මෙම නිලධාරීයා සම්බන්ධයෙන් පවත්වනු ලැබූ නඩු විභාගයෙන් ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ තීරණය, මහ අධිකරණයේ තීරණය හා ආයතන සංග්‍රහයේ **XLVIII** වන පරිච්ඡේදයේ 22 වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් නිලධාරීයාට එරෙහිව පැවැත්වූ විධිමත් විනය පරීක්ෂණයෙන්ද ඔහුට එරෙහිව නගා ඇති සියලු චෝදනා සඳහා වැරදිකරු ලෙස තීරණය කළ ද ඔහු ලබා ගෙන ඇති තුටු පඩුරේ ස්වභාවයත්, ඔහුට එරෙහිව පෙර වැරදි නොමැති වීමත්, වසර 12කට අධික කාලයක් රාජකාරී	විගණන නිරීක්ෂණ පිළිගතිමි.	ආයතන සංග්‍රහය හා පවතින නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, තීරණ ගැනීමේදී නිලධාරීන් හට වැරදි පූර්වාදර්ශයක් නොවන පරිදි වූ තීරණ ගත යුතුය.

	වැඩ තහනමකට ලක් වී තිබීමත් යන කරුණු සැලකිල්ලට ගෙන මොහු 2024 මැයි 15 දින රාජකාරී වැඩ තහනමට ලක්වූ කාල සීමාවට වැටුප් ගෙවීමකින් තොරව දිස්ත්‍රික් ලේකම් විසින් නැවත වරක් සේවයේ පිහිටුවා තිබුණි.		
(ඇ)	වසර 05ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් තනතුරුවල/ සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා වහාම ස්ථානමාරු ලබාදිය යුතු වුවද, ඊට පටහැනිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක 2024 දෙසැම්බර් 31 දිනට සේවා කාලය වසර 05 ඉක්ම වූ නිලධාරීන් 55 දෙනෙකු සේවය කරමින් පැවතුණි.	විගණන නිරීක්ෂණ අවධානයට ගෙන කටයුතු සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දුනිමි.	වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් වන නිලධාරීන් පිළිබඳ තොරතුරු විධිමත් පරිදි ලබාගෙන ස්ථාන මාරුවීම්වලට නිලධාරීන් යොමු කළ යුතුය.
(ඈ)	2024 වර්ෂය සඳහා මානව සංවර්ධන සැලැස්මෙහි තනතුරු 07කට අදාළව නිලධාරීන්ට තිබිය යුතු තාක්ෂණික නිපුණතා හඳුනාගෙන නොතිබුණු අතර විධායක තනතුරු 07ක් සඳහා කාර්යයන් ඉටුකිරීම සඳහා අත්‍යාවශ්‍යයෙන්ම තිබිය යුතු තාක්ෂණික නිපුණතා ලෙස මෘදුකාංග පිළිබඳ දැනුම පමණක් සඳහන් කර තිබුණි. තවද ඒ ඒ තනතුරු වලට අදාළව තවදුරටත් නිපුණතා පරතරය පිරවීම උදෙසා පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය කිරීමකින් තොරව පුහුණු සැලැස්ම පිළියෙල කර තිබුණි.	විගණන නිරීක්ෂණ අවධානයට යොමු කරමින් 2024 මානව සංවර්ධන සැලැස්මේ ඇති අඩුපාඩු හඳුනාගත් අතර, එම අඩුපාඩු සකස් කර ගනිමින් 2025 වසර සඳහා මානව සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම සිදු කර ඇත.	චක්‍රලේඛ ප්‍රකාරව මානව සංවර්ධන සැලැස්ම පිළියෙල කළ යුතු අතර නිපුණතා පරතරය හඳුනා ගනිමින් පුහුණු සැලැස්ම පිළියෙල කළ යුතුය.
(ඉ)	2024 මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුල නිපුණතා පරතරය පිරවීම සඳහා සැලසුම් කර තිබූ සේවකයන්ගේ ධාරිතාව හා අභිප්‍රේරණය ඉහළ නැංවීම සඳහා නිරන්තරයෙන් අවශ්‍යවන සැලසුම් කළ විෂයානුබද්ධ අනෙකුත් පුහුණු වැඩසටහන් 07ක් 2024 වර්ෂයේදී පවත්වා නොතිබුණි. එසේම 2024 පුහුණු ප්‍රගතිය අනුව කාර්යාල කාර්ය සහයක සේවයේ නිලධාරීන් සඳහා කිසිදු පුහුණු වැඩසටහනක් පවත්වා නොතිබුණි.	2024 අගෝස්තු මාසය වන විට පුහුණු වැඩසටහන් 15ක්ද එම වර්ෂයේ බඳවා ගන්නා ලද ග්‍රාම නිලධාරීන් සඳහා දින 15ක සේවාරම්භක පුහුණුවක් පවත්වා ඇත. 2024 වර්ෂය මැතිවරණ වර්ෂයක් වූ බැවින් පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු කිරීමට නොහැකි වූ අතර 2025 වර්ෂයේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට උපදෙස් ලබා දුනිමි.	චක්‍රලේඛ විධිවිධාන අනුව පුහුණු අවශ්‍යතා ඉටුවන ආකාරයට පුහුණු සැලැස්ම සකස් කිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.